# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2083/35 - 2018 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2018.08.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(x)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25 (අ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 (අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පීවී 101137 දරන සමාගමක් වන එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, මේ පනත යටතේ සාදන ලද සහ 2016 දෙසැම්බර් මස 02 වන දින අංක 1995/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නියමයේ උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසි වලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''විද්‍යුත් සහ ඉංජිනේරු කළමනාකරණ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

එස් එල් ටී කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද තාක්ෂණවේදී විද්‍යුත් ගෞරව උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ දී, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ භෞතික විද්‍යා හෝ ජීව විද්‍යා හෝ තාක්ෂණ විද්‍යා යන විෂය ධාරාවලින් කවර හෝ විෂය ධාරාවකින් 'S' (සාමාන්‍ය) සාමාර්ථ තුනක් (3) එකවර ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම යන්නට අනුකූලව කටයුතු කළ යුතු ය.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වූ කෙටි යෙදුම* |
|---|---|
| තාක්ෂණවේදී විද්‍යුත් ගෞරව උපාධිය | බී ටෙක් (ගෞරව) විද්‍යුත් |

08 - 867


1A - PG 4163 — 507 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*